ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்

LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எமது இல / OUR NO	4/1/වක්‍රලේඛ/2012	ඔබෙ අංකය / உமது இல / YOUR NO		දිනය / திகதி	2012/10/18

.....
.....
.....
.....

05 NOV 2012

විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් ලබා දීම කඩිනම් කිරීම

විශේෂ ආයෝජන ව්‍යාපෘති වෙනුවෙන් රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් ලබා දීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා පවතින ක්‍රමවේදය සරළ කිරීමට අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති ආයෝජන ප්‍රවර්ධනය පිළිබඳ සාකච්ඡාවේදී මා වෙත උපදෙස් ලැබී ඇත.

2. ඒ අනුව දැනට ක්‍රියාත්මක කරන ක්‍රමවේදය අධ්‍යනය කර සකස් කරන ලද නව ක්‍රියාවලිය හා ක්‍රියා කළයුතු ආකාරය දැක්වෙන මගේ අංක 4/1/වක්‍රලේඛ/2012 හා 2012/10/18 දිනැති වක්‍රලේඛයේ පිටපතක් ඔබතුමන් කාරුණික දැන ගැනීම සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

3. වක්‍රලේඛයේ 2 වන පියවර වෙත ඔබගේ කාරුණික අවධානය යොමු කරවන අතර ඊට අදාල නිලධාරී කමිටුව පත් කර ගැනීම සඳහා ඔබගේ කාරුණික සහයෝගය අපේක්ෂා කරමි.

4. ඒ අනුව මූලික නිර්දේශ සකස් කිරීම සඳහා වන නිලධාරී කමිටුව සඳහා ඔබ ආයතනය නියෝජනය කරන නිලධාරියාගේ නම, තනතුර හා පහසුවෙන් සම්බන්ධ කර ගත හැකි දුරකතන අංකය 2012/10/31 දින හෝ එදිනට පෙර Fax අංක 011-2864051 හෝ 011-2873110 මඟින් මා වෙත ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. අදාල කමිටුවට නම් කරන නිලධාරියා ආයතන ප්‍රධානියා නොවන අවස්ථාවේදී ඔබ ආයතනය වෙනුවෙන් ක්ෂේත්‍රයේදී තීරණයක් ගත හැකි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් මේ සඳහා නම් කර එවන ලෙස වැඩි දුරටත් ඉල්ලා සිටිමි.

5. මෙම කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ කඩිනම් අවධානය අපේක්ෂා කරන අතර ඔබතුමන්ගෙන් ලැබෙන සහයෝගය අපේක්ෂා කරමි.

ආර්.පී.ආර්.රාජපක්ෂ,
ඉඩම් කොමසාරිස් ජනරාල්